කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

සමාජීයවිද්‍යා පීඨය

ජාත්‍යන්තර අධ්‍යයනය

ජාත්‍යන්තර දේශපාලනය INTS – E 3015

(නව නිර්දේශය)

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. පළමුවන ලෝක සංග්‍රාමයේ සිට වර්තමානය දක්වා ජාත්‍යන්තර දේශපාලනයේ ඇතිවූ ප්‍රධාන වෙනස්කම් විස්තර කරන්න.

02. ජාත්‍යන්තර දේශපාලනය සම්බන්ධව ගොඩනැගී ඇති යථාර්ථවාදී සහ ලිබරල්වාදී න්‍යායාත්මක විග්‍රහයන් සන්සන්දනය කරන්න.

03. <u>එක්කෝ</u>

ලෝක වෙළඳාමෙහි ආරක්ෂණවාදය භාවිතා වන ආකාරය පැහැදිලි කොට වර්තමානයේදී චීනය සහ ඇමරිකාව අතර ඇතිවී තිබෙන වෙළඳ අර්බුදයෙහි බලපෑම් විග්‍රහ කරන්න.

<u>නැතහොත්</u>

දකුණු චීන මුහුදේ අර්බුදය විස්තර කොට, ඊට ආසියාන් සංවිධානයෙහි මැදිහත්වීම විග්‍රහ කරන්න.

04. යුරෝපයට සිරියානු සරණාගත අර්බුදය හේතුවෙන් ඇතිවී තිබෙන ආර්ථික සහ දේශපාලන බලපෑම් පැහැදිලි කරන්න.

05. <u>එක්කෝ</u>

එක්සත් ජාතීන්ගේ සංගමය බිහිවීමට හේතු වූ පසුබිම සහ එහි ප්‍රධාන ආයතනයන් හි කාර්යභාරය විස්තර කරන්න.

<u>නැතහොත්</u>

අවිහරණයේ අවශ්‍යතාව සඳහන් කොට ඒ සඳහා ඇති අභියෝග විස්තර කරන්න.

06. අප්‍රිකානු කලාපයේ ඇති ගැටුම් වලට හේතු හඳුනාගනිමින් එහි කලාපීය සංවිධාන විසින් එම ගැටුම් විසඳාගැනීමට ගෙන ඇති උත්සාහයන් විස්තර කරන්න.

07. i. ගැටුම් නිර්වචනය කොට ගැටුම් සඳහා බලපාන හේතු විස්තර කරන්න.

ii. ජාත්‍යන්තර ගැටුම් නිරාකරණයේදී තුන්වන පාර්ශවීය මැදිහත්කරණය පිළිබඳ පැහැදිලි කරන්න.

08. විවිධ ගැටුම් නිරාකරණ ක්‍රමවේදයන්හි වෙනස්කම් හඳුනාගනිමින් ගැටුම් නිරාකරණය සඳහා එම ක්‍රමවේද වල ප්‍රායෝගිකත්වය පිළිබඳ විග්‍රහ කරන්න.

*******************